මීගමුව අධ්‍යාපන කලාපය
දෙවන වාර ඇගයීම - 2024
හූගෝල විද්‍යාව

2024.08.29

විභාග අංකය/නම:.............................................

| 6 ශ්‍රේණිය | I හා II පත්‍රය | කාලය පැය 02 යි |
|---|---|---|

## 1 කොටස

❖ සියලුම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

❖ අංක 1 සිට 5 දක්වා ප්‍රශ්න වලට අදාළ නිවැරදි පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.

1. ශ්‍රී ලංකාවේ පිහිටි කුඩාම පරිපාලන ඒකකය වන්නේ

   I පළාත  II ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය

   III ග්‍රාම නිලධාරී කොට්ඨාසය  IV දිස්ත්‍රික්කය

2. දිස්ත්‍රික්කයට වඩා පළාත

   I විශාල වේ.  II කුඩා වේ.

   III වෙනසක් නොමැත.  IV කිව නොහැකි ය.

3. ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස කිහිපයක් එක්වී නිර්මාණය වන්නේ

   I ග්‍රාම නිලධාරී කොට්ඨාසය  II ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය

   III පළාත  IV දිස්ත්‍රික්කය

4. නිවැරදිව දිශාව හඳුනා ගැනීමට භාවිතා කරයි

   I මාලිමාව  II සුළං දිශා දර්ශකය

   III අනිලමානය  IV වර්ෂාමානය

5. උතුරු දිශාව සහ බස්නාහිර දිශාව අතර පිහිටා ඇත්තේ,

   I වයඹ දිශාව  II නිරිත දිශාව

   III ඊසාන දිශාව  IV ගිණිකොණ දිශාව

Learning Resource Center
R
De Mazenod College
Kandana

❖ අංක 6 – 10 දක්වා ප්‍රශ්න වලට නිවැරදි පිළිතුර වරහනින් තෝරා ලියන්න.

(නුවරඑළිය , භූ විෂමතාව, ගම්පහ, උතුරු මැද, සූර්යයා )

6. පෘථිවියට තාපය මෙන්ම ආලෝකය ලැබෙන්නේ ................................. මගිනි.

7. ශ්‍රී ලංකාවේ අනුරාධපුර හා පොළොන්නරුව ඓතිහාසික නගර අයත් වන්නේ ................................. පළාතටය.

8. අවම උෂ්ණත්වයක් නිරන්තරයෙන් ........................ දිස්ත්‍රික්කයෙන් වාර්තා වේ.

9. භූමිය මතුපිට දැකිය හැකි වෙනස්කම්.................................. ලෙස හඳුන්වයි.

10. ඔබගේ පාසල අයත්වන්නේ.................................. පළාතටය.

❖ ගැළපෙන පිළිතුර තෝරා යා කරන්න.

| A | B |
|---|---|
| 11. ග්‍රාම නිලධාරී කොට්ඨාසය භාරව කටයුතු කරයි | දකුණු පළාත |
| 12. මාතර දිස්ත්‍රික්කය මේ පළාතට අයත්ය | අධ්‍යාපන කලාපය |
| 13. වැඩිම දිස්ත්‍රික්ක ගණනක් ඇති පළාතකි | ග්‍රාම නිලධාරී |
| 14. පාසලක නමට ඉදිරියෙන් යොදයි | පොලිස් ස්ථානය |
| 15. නීතිය හා සාමය සුරකින ආයතනයකි | උතුරු පළාත |

❖ 16 - 20 දක්වා ඇති ප්‍රකාශ නිවැරදි නම් ( √ ) ලකුණ ද වැරදි නම් ( X ) ලකුණ ද ඉදිරියේ ඇති වරහන තුළ යොදන්න.

16. පිළිමතලාව වෙස් මුහුණු කර්මාන්තයට ප්‍රසිද්ධියක් උසුලයි. ( )

17 දේශාංශ $180^{0}$ ජාත්‍යන්තර දින රේඛාව ලෙස හඳුන්වයි. ( )

18. සිතියමක හෝ සැලැස්මක දිශාව පෙන්වන්නේ උතුරු දිශාවෙනි ( )

19. ගොවිතැනේ දී ගැඩවිලා පස සාරවත් කිරීමට උදව් වන සතෙක් නොවේ ( )

20. ගාල්ල දකුණු පළාතට අයත් දිස්ත්‍රික්කයකි ( )

( ල 02 X 20 - 40 )

## II කොටස

❖ පළමු ප්‍රශ්නය අනිවාර්ය වේ.
❖ අනෙකුත් ප්‍රශ්න අතරින් හතරකට පිළිතුරු ලියන්න.
❖ පිළිතුරු සැපයිය යුතු මුළු ප්‍රශ්න සංඛ්‍යාව පහකි.

1) පහත දැක්වෙන කාලගුණික අංග මැනීමට යොදා ගන්නා උපකරණය හා මණින ඒකකය ලියන්න.

I

| කාලගුණික අංග | මනින උපකරණය | ඒකකය |
|---|---|---|
| වර්ෂාපතනය | | |
| උෂ්ණත්වය | | |
| | අනිලමානය | |

( ල. 06 )

II කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුව පිහිටා ඇත්තේ කොහේද ? ( ල . 02 )

III සුළගේ දිශාව මැනීම සඳහා වන සරල උපකරණයක් සකස් කර ගත හැකි ආකාරය කෙටියෙන් විස්තර කරන්න. ( ල . 06 )

IV කාලගුණය පිළිබඳ නිවැරදි තොරතුරු දැනගැනීම මගින් ඇති ප්‍රයෝජන දෙකක් ලියන්න. ( ල . 02 )

2)

I. ශ්‍රී ලංකාව බෙදා ඇති මුළු දිස්ත්‍රික්ක ගණන කොපමණද ? ( ල . 02 )

II. ඔබගේ පාසල පිහිටා ඇති දිස්ත්‍රික්කය කුමක්ද ? ( ල . 02 )

III. ඔබගේ පාසලේ නම ලියා එහි මුලින් ඇති අකුරු වලින් කියවෙන අදහස ලියන්න. ( ල . 02 )

IV. බස්නාහිර පළාතට හා උතුරු මැද පළාතට අයත් දිස්ත්‍රික්ක ලියා දක්වන්න. ( ල . 05 )

3)




ඉහත රූප සටහන ඇසුරින් පිළිතුරු ලියන්න.

I. පාසලට උතුරින් ______________________ පිහිටා ඇත.

II. ______________________ පිහිටා ඇත්තේ පාසලට ඊසාන දිශාවෙනි.

III. පාසලට______________________ පිහිටි ගරාජය දෙසින් පිරු බැස යනු පෙනේ.

IV. වැව හා බැංකුව අතර ______________________ දිශාවෙන් කුඹුරු යාය පිහිටයි.

V. වෙළඳසැල පිහිටියේ පාසලට______________________ දිශාවෙනි.

VI. පාසලට______________________ දිශාවෙන් බැංකුව පිහිටයි.

VII. රෝහලට ප්‍රතිවිරුද්ධ දිශාවේ ______________________ පිහිටයි.

( ල . 07 )

( II ) සැලැස්මක් හා චිත්‍රයක් අතර වෙනස්කම් දෙකක් ලියන්න.

| සැලැස්ම | චිත්‍රය |
|---|---|
| • | • |
| • | • |

( ල . 04 )

4) ගතවූ පැය 24 තුළ දිවයිනේ උපරිම උෂ්ණත්වය වූ 34 C⁰ මන්නාරම් දිස්ත්‍රික්කයෙන් ද අවමය වූ 18 C⁰ නුවරඑළිය දිස්ත්‍රික්කයෙන් ද වාර්තා විය. දිවයිනේ බස්නාහිර , සබරගමුව හා මධ්‍යම කඳුකරයේ බටහිර බෑවුම් වලට සවස් කාලයේ වැසිවාර කීපයක් ද ලැබී ඇත. සුළගේ වේගය පැයට කිලෝමීටර් 16 පමණ වේ.

ඉහත දක්වා ඇත්තේ කාලගුණ වාර්තාවක පිටපතකි. ඒ ඇසුරින් අසා ඇති ප්‍රශ්න වලට පිළිතුරු ලියන්න.

I) ඉහත කාලගුණ වාර්තාවේ ඇති කාලගුණික අංග 3 නම් කරන්න. ( ල . 03 )

II) උපරිම හා අවම උෂ්ණත්වයන් වාර්තා වූ දිස්ත්‍රික්ක හා ප්‍රමාණයන් දක්වන්න. ( ල . 04 )

III) ජල චක්‍රය රූප සටහනක් මගින් දක්වා ඒ පිළිබඳ කෙටි විස්තරයක් කරන්න. ( ල . 04 )

5) එක්තරා පාසලක අවට භූ දර්ශනයේ දක්නට ලැබුණු දෑ පහත පරිදි වේ.

( පොකුණ , කුඹුරු යාය , ගංගාව , උද්‍යානය , නිවාස සංකීර්ණය, දියඇල්ල , තැනිතලාව )

I) ඉහත තොරතුරු ඇසුරින් පහත වගුව සම්පූර්ණ කරන්න ( ල 07 )

| ස්වභාවික ලක්ෂණ | මිනිසා විසින් නිර්මාණය කරන ලද ලක්ෂණ |
|---|---|
| • | • |
| • | • |
| • | • |
| | • |

II ) කඳුකර බිමක පිහිටි නිවසක ජීවත් වන ජීවීන්ට මුහුණ පෑමට සිදුවන වාසි 2ක් හා අවාසි 2 ක් ලියන්න. ( ල 04)

6) නිවැරදි පිළිතුර ඉදිරියෙන් ලියන්න.

1 )

I බීජ පරාගනයට උදවු කරන සතෙකි ........................................

II පිත්තල භාණ්ඩ නිපදවන ප්‍රදේශයකි ........................................

III වගාවට හානිකර ගොළුබෙල්ලන් කා දමන සතෙකි. ........................................

IV දුම්බර ප්‍රදේශයේ වඩාත් ප්‍රසිද්ධ කර්මාන්තයකි........................................

V මහාමාරිය බෝ වන්නේ මෙම සත්වයාගෙනි........................................

VI පාරම්පරික වෙස් මුහුණු කර්මාන්තය කරන ප්‍රදේශයකි........................................

VII රාත්‍රියෙහි හැසිරෙන සත්වයෙකි ........................................ ( ල 07 )

II) බෞද්ධ , හින්දු , ඉස්ලාම් සහ කතෝලික ආගමික උත්සව එක බැගින් ලියන්න. ( ල 04)



REGISTRAR
De Mazenod College
Kandana.